## 476 දුක්බර දිවියක

දුක්බර දිවියක රහසක් ඇත මට
ජය බිම සිකුරු නිසා
විඳෑ ගැනුමට ඇත දහසක් කරදර
සිතුවිලි හොඳ හින්දා
අපවාදය පිරි රැවුම් බැනුම් මැද
නොසැලෙන ගතිය නිසා
සතුරන් මැද්දේ දිවිය ගෙවන්නෙමි
සමිඳුගෙ මහිමෙ පතා

නොමවී බේදෙන් අඩපණ වී
එක්වී රොක්වෙමු එකට බැඳී

කුසගින්නත් ඇත නිවහනයක් නැත
හැඳුනුම නොලත් නිසා
සේවය ලැබුමට සැම දෙන ආවේ
ශක්තිය ඇතැයි සිතා
සමිඳුන් සෙව්වේ සේවය පැතුවේ
කිතු හිමි දකිනු පතා
දුබලවූ මා ළඟ කිතු හිමි සිටියේ
මගෙ පණ රකිනු සොඳා

තනිවී සිටියෙමි මිතුරන් නොමැතිව
බොරුවක් නොකළ නිසා
යහපත් වදනින් හිංසා නොමැතිව
ඉවසම් සාමෙ පතා
සමිඳුගෙ ජීවිතෙ මීටත් කටුකයි
ගැලවුම් කරුවූ නිසා
කිතු හිමි නොවන්න මා ඇත තනිවී
දහිරිය නැතිව සදා